**<u>නේෂන් කිඩ්ස් ගිණුමට (Nations Kidz Account) අදාල නියමයන් සහ කොන්දේසි.</u>**

1. නේෂන්ස් කිඩ්ස් ගිණුම ("ගිණුම") මාපියාගෙන් (මාපියන්ගෙන්)/නීතිමය වශයෙන් පත්කළ භාරකරුගෙන් (භාරකරුවන්ගෙන්) ලැබෙන උපදෙස් මත සහ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්ස් ("බැංකුව") විසින් නියම කරන ලේඛන ඉදිරිපත් කිරීමට පසුව බාලවයස්කාර ළමයාගේ ("ගිණුම් හිමියාගේ") නමින් පාස්පොතක් සහිත ඉතිරි කිරීමේ ගිණුමක් වශයෙන් පමණක් විවෘත කළ හැකිය.

2. මෙම ගිණුමට අදාල වන නියමයන් සහ කොන්දේසි, ආරම්භක තැන්පතුව, අවම ශේෂය, පොලී අනුපාතය, පොලිය ගණනය කරන ක්‍රම වේදය සහ එය ගිණුමට බැර කිරීම හුදෙක් බැංකුවේ වර්තමාන රීති සහ රෙගුලාසිවලට අනුව සිදුවනු ලැබේ. බැංකුවවේ තනි අභිමතය පරිදි මෙම රීති සහ රෙගුලාසි වෙනස් කිරීමට/ප්‍රතිශෝධනය කිරීමට බැංකුව විසින් සිය අයිතිය තවදුරටත් තබාගනු ලැබේ.

   නියමිත අවම ශේෂය පවත්වාගෙන යාම නොකරන විටක දී, ගිණුම වසා තැබීමේ අයිතිය ද බැංකුව විසින් තවදුරටත් තබාගනු ලැබේ.

3. අදාල නීති මගින් නියම කරන පරිදි ගිණුම් හිමියා වයෝපූර්ණත්වයට පත් වූ පසුව, එකී ගිණුම සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුමක් බවට හැරවීමට බැංකුව විසින් නියම කරන ලේඛන ගිණුම් හිමියා විසින් ඉදිරිපත් කරන තුරු සහ ඉදිරිපත් කරන්නේ නම් මිස, ගිණුම අවහිර කරන අතර, ගිණුම හරහා ගණුදෙනු කිරීමට අවසර දෙනු නොලැබේ.

4. ගිණුම විවෘත කරන මාපියාට (මාපියන්ට)/භාරකරුට (භාරකරුවන්ට) පාස්පොතක් නිකුත් කරනු ලබන අතර, එය සුරක්ෂිතව තබාගැනීම මාපියාගේ (මාපියන්ගේ)/භාරකරුගේ (භාරකරුවන්ගේ) වගකීම වේ. මෙම පාස්පොත නැතිවීම, සොරකම් කිරීම හෝ අස්ථානගත වීම සිදු වූ විටක දී ඒ බව ලිඛිතව බැංකුවට දැනුම් දිය යුතුය. මෙම පාස්පොත නැතිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් දරන යම් අලාභ, හානි, පිරිවැය (යම් නීතිමය ගාස්තු ඇතුළුව) හෝ ඉල්ලීම්වලට එරෙහිව මාපියා (මාපියන්)/ භාරකරු (භාරකරුවන්) බැංකුවට හානිපූරණය කිරීම කළයුතුය.

5. ගිණුමට කරන තැන්පතුවල අර්ථලාභියා ගිණුම් හිමියා වේ. ගිණුම් හිමියා වයෝපූර්ණත්වයට එළඹීමට පෙර ගිණුමෙන් කරන මුදල් ආපසු ගැනීම් හුදෙක් බැංකුව විසින් තීරණය කරන පරිදි ගිණුම් හිමියාගේ තීරණාත්මක අවශ්‍යතාවයන් වෙනුවෙන් පමණක් අවසර දෙනු ලැබේ.

6. ගිණුම් හිමියාගේ මරණය සිදු වුවහොත් ගිණුමේ මුදල් අදාළ නීතිය අනුව බෙදාහරිනු ලැබේ.

7. ගිණුම් හිමියා වයෝපූර්ණත්වයට එළඹීමට පෙර ගිණුම වසා දැමුවහොත්, පොලී අනුපාතය බැංකුවේ තනි අභිමතය පරිදි තීරණය කරනු ලැබේ.

8. බැංකුව විසින් අන්‍යාකාරයෙන් තීරණය කරන්නේ නම් මිස, ගිණුමට කරන තැන්පතු සහ ගිණුමෙන් මුදල් ආපසු ගැනීම් ගිණුම විවෘත කරන ලද බැංකු ශාඛාවේ අවසරය මත පමණක් සිදුවිය යුතුය.

9. බැංකුව විසින් තීරණය කරන නියමයන් සහ කොන්දේසි මත ගිණුම් හිමියා සඳහා බැංකුව විසින් තිළිණ පිරිනැමීමේ යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබිය හැකිය. එකී තිළිණ යෝජනා ක්‍රමය දැනුම් දීමකින් තොරව බැංකුවේ අභිමතය පරිදි අවලංගු කිරීම හෝ ප්‍රතිශෝධනය කිරීම සඳහා අයිතිය බැංකුව විසින් තවදුරටත් තබාගනු ලැබේ.

   දැනටමත් පිරිනමා ඇති යම් තිළිණවල වටිනාකම සහ පිරිවැය එවැනි තිළිණ යෝජනා ක්‍රමයකට අදාල නියමයන් සහ කොන්දේසිවලට අනුකූල නොවීම නිසා යම් කවරම විටක දී වුව ද, අයකර ගැනීමේ (ගිණුමට හර කිරීමෙන්) අයිතිය බැංකුව විසින් තවදුරටත් තබාගනු ලැබේ.

10. ගිණුමේ සිදුවන ගණුදෙනු අදාල රජයේ අයබදුවලට යටත් වනු ලැබේ.

11. මෙම ඝණයේ ගිණුම් යටතේ බැංකුව විසින් භාරයන් පිළිගැනීම හෝ හඳුනාගැනීම සිදුකරනු නොලැබේ.

12. මෙම නියමයන් සහ කොන්දේසි සංශෝධනය කිරීමේ අයිතිය බැංකුව විසින් තවදුරටත් තබාගනු ලැබේ. ඒ සම්බන්ධ දැන්වීම බැංකුවේ ආයතනික වෙබ් අඩවය ඔස්සේ, SMS හරහා කෙටි පණිවුඩයක් මගින්, බැංකුවේ ඩිජිටල් වැනල හරහා සහ/හෝ බැංකුව විසින් තීරණය කරනු ලැබිය හැකි යම් වෙනත් ක්‍රමයක් ඔස්සේ සපයනු ලැබේ.

13. මෙම නියමයන් සහ කොන්දේසි ශ්‍රී ලංකාවේ නීතිය අනුව පාලනය වන අතර, ඒ අනුව වටහා ගත යුතු වේ.

මෙම නියමයන් සහ කොන්දේසි යටතේ මා/අප විසින් ඉල්ලුම් කර ඇති මෙම ගිණුම් පහසුකමට (ගිණුම් පහසුකම්වලට)/සේවාවට (සේවාවන්ට) අදාලව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී හි සාමාන්‍ය ව්‍යාපාර කොන්දේසිවල සහ අනෙත් නියමයන් සහ කොන්දේසිවල මෙන්ම මෙම ගිණුම් පහසුකමට (ගිණුම් පහසුකම්වලට)/සේවාවට (සේවාවන්ට) අදාළ තොරතුරුවලට මා/අප විසින් අත්සන් කිරීමට පෙර ඒවා මා අප වෙත ලබා දී පැහැදිලි කරදුන් බව මා විසින්/අප විසින් මෙයින් සහතික කර සිටින අතර, මෙහි අඩංගු විස්තර, නියමයන් සහ කොන්දේසි මා/අප විසින් කියවා වටහා ගත් බවත්, මා/අප එයින් බැඳී සිටිමට කැමැත්ත පලකොට එකග වන ලද බවත් මෙයින් ප්‍රකාශ කර සිටිනු ලැබේ.

.............................................................................................................  .............................................................................

මාපියාගේ/භාරකරුගේ අත්සන  දිනය.